AEC Australian Electoral Commission

# ඔබේ ඡන්දය වලංගු කරගත හැකි අයුරු

ඡන්දය දා ඔබට ඡන්ද පත්‍රිකා දෙකක් ලැබෙනු ඇත: නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා **කොළ** පැහැති එකක් හා සෙනෙට් සභාව සඳහා **සුදු** පැහැති එකකි.

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

**කොළ පැහැති ඡන්ද පත්‍රිකාව** මත, ඔබේ පළමු මනාපය හිමි අපේක්ෂකයා පැත්තේ ඇති කොටුවෙහි '1' ද, දෙවැනි මනාපය පැත්තේ ඇති කොටුවෙහි '2' ද, ආදී වශයෙන් සියලුම කොටු අංකනය කර අවසන් වන තුරු ලකුණු කළ යුතුය.

ඔබේ ඡන්දය වලංගු වීම සඳහා **සියලුම කොටු** අංකනය කළ යුතුමය.




නියැදි චන්ද පත්‍රිකාව

## සෙනෙට් සභාව

**සුදු පැහැති චන්ද පත්‍රිකාව** මත ඔබට රේඛාවට ඉහළින් හෝ පහළින් ඡන්දය ප්‍රකාශ කිරීමට තෝරා ගත හැකිය.







නියැදි ඡන්ද පත්‍රිකා

### එක්කෝ රේඛාවට ඉහළින්

රේඛාවට ඉහළින් ඡන්දය ප්‍රකාශ කළහොත්, 1 සිට 6 දක්වා **අවම වශයෙන් කොටු 6ක්** ඔබ අංකනය කළ යුතුමය.

ඔබේ පළමු මනාපය හිමි පක්ෂය හෝ කණ්ඩායම සඳහා ඇති කොටුවෙහි '1' ද දෙවැනි මනාපය හිමි පක්ෂය හෝ කණ්ඩායමට අයත් කොටුවෙහි '2' ලෙසින් අවම වශයෙන් කොටු හයක් අංකනය කළ යුතුමය. රේඛාවට ඉහළින් කැමති කොටු ප්‍රමාණයක ඔබට දිගටම අංක ලකුණු කළ හැක.

### එසේ නැතහොත් රේඛාවට පහළින්

රේඛාවට පහළින් ඡන්දය ප්‍රකාශ කළහොත්, 1 සිට 12 දක්වා **අවම වශයෙන් කොටු 12ක්** ඔබ අංකනය කළ යුතුමය.

ඔබේ පළමු මනාපය හිමි අපේක්ෂකයා පැත්තෙහි ඇති කොටුවෙහි '1' ද දෙවැනි මනාපයට අයත් කොටුවෙහි '2' ලෙසින්ද අවම වශයෙන් කොටු දොළසක් ඔබ අංකනය කළ යුතුමය. රේඛාවට පහළින් කැමති කොටු ප්‍රමාණයක ඔබට දිගටම අංක ලකුණු කළ හැක.

**අත්වැරැද්දක් සිදුවුවද කලබල නොවන්න.**

ඔබට නව ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා ගෙන මුල සිට පටන්ගත හැකිය.



Authorised by the Electoral Commissioner, Canberra